**ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය - 2019**
**-------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සම්මේලනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින්  කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සම්මේලනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුවේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම්වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සම්මේලනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සම්මේලනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සම්මේලනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට පාපන්දු ක්‍රීඩා මධ්‍යස්ථාන දෙකක ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණද රු.15,741,004 ක් වූ අගය තවදුරටත් කෙරිගෙන යන වැඩ යටතේ දක්වා තිබීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණවල වටිනාකම රු.15,741,004 ක් සහ එම වත්කම් මත වාර්ෂික ක්ෂයවීම් රු.524,175 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2020 වර්ෂයේදී නිවැරදිව කිරීමට කටයුතු කරනු ඇත. | වැඩ අවසන් කරන ලද ක්‍රීඩා මධ්‍යස්ථාන වලට අදාල වටිනාකම් ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) සම්මේලනයේ හිටපු මුදල් කළමනාකරු විසින් තරඟ විනිසුරුවන් ලෙස ව්‍යාජ නම් ඇතුලත් කර මුදල් ලබාගෙන තිබුණු බව 2017 වර්ෂයේදී සම්මේලනය විසින් අනාවරණය කරගෙන තිබුණු අතර මෙම මුදල් වංචාව සම්බන්ධයෙන් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැඩිදුර පරික්ෂණ පවත්වා වංචාව අධිකරණය වෙත යොමුකර තිබුණි. වංචා කරන ලද මුළු මුදල | අදාළ නඩු කටයුතු අවසානයේදී ලබාදෙන උසාවි තීරණයන් සමගම මෙය පිළිබඳ අවසාන නිගමනය ලබා ගැනීමට බලාපොරොත්තු වේ. | වංචා කරන ලද මුදල් ප්‍රමාණය පිළිබඳ නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු අතර එම මුදල් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| සම්මේලනය විසින් රු.46,860,672 ක් ලෙස 2020 අගෝස්තු මාසයේදී අනාවරණය කරගෙන තිබුණු අතර, මෙම වංචාවට අදාළව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් අරමුදල් මාරුකිරීම් ලෙස රු.16,053,116 ක් පමණක් ලැබිය යුතු ගිණුම් යටතේ දක්වා තිබුණි. වංචා කරන ලද මුදල් අයකර ගැනීම සඳහා සම්මේලනය විසින් 2020 වර්ෂයේ අගෝස්තු අවසානය වන විටත් කටයුතු කර නොතිබුණු අතර ඒ අනුව මෙම මුදල් අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳ විගණනයට තහවුරු කරගත නොහැකි විය. | | |
| (ඇ) පළාත් පාලන ආයතන සමග ඇතිකරගත් අවබෝධතා ගිවිසුම් මත සම්මේලනය භාවිතයට ගනු ලබන පළාත් පාලන ආයතන වලට අයත් ක්‍රීඩාපිටිවල සංවර්ධන කටයුතු සඳහා ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය මගින් සෘජුවම දේශීය හා විදේශීය කොන්ත්‍රාත්කරුවන් ලවා කරන ලද ඉදිකිරීම්වල වටිනාකම කල්බදු වත්කම් යටතේ වැරදි ලෙස ගිණුම්ගත කර තිබුණු අතර ඒමත විලම්භිත අයභාර බැරකමක් වශයෙන් රු.137,994,358 ක් ශේෂපත්‍ර දිනට ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් 2016, 2017 හා 2018 වර්ෂවල විගණකාධිපති වාර්තා මගින් පෙන්වා දී තිබුණද මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීම් කර නොතිබුණි. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | කල්බදු වත්කම් වල නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය . |
| (ඇ) 2019 දෙසැම්බර් 31 දිනට කල්බදු යටතේ ගිණුම්ගත කර තිබුණු පිරිවැය රු.5,306,765 ක් වූ යාපනය පාපන්දු ක්‍රීඩා සංකීර්ණය වෙනුවෙන් 2011 වර්ෂයේ සිට ක්‍රමක්ෂය ප්‍රතිපාදනයන් සිදු කර නොතිබුණි. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ක්‍රමක්ෂය ප්‍රතිපාදන නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට ක්‍රියාකළ යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයන්ට අදාළව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| විෂය | වටිනාකම | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) ලැබිය යුතු ගිණුම් | 13,234,765 | ශේෂ සනාථ කිරීම් | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් වගකීම් ආදායම් හා වියදම් වලට අදාළ ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ)රඳවා ගත් ඉපයුම් | 4,582,669 | විස්තරාත්මක උපලේඛන | | |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂ ඇතුළුව 2019 දෙසැම්බර් 31 දිනට සම්මේලනය විසින් ක්‍රීඩා තරඟාවලි සහ ක්‍රීඩා සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා තරඟ සංවිධානකරුවන්ට ලබාදී පියවා නොතිබුණු අත්තිකාරම්වල එකතුව රු.1,465,997 ක් විය. ලබාදිය යුතු උපරිම අත්තිකාරම් මුදල තීරණය කර නොතිබුණු අතර, නියමිත කාර්යය අවසන් වූ පසු ප්‍රමාද වී අත්තිකාරම් පියවා තිබීම සම්බන්ධයෙන් සම්මේලනය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අවස්ථාවෝචිතව උපරිම අත්තිකාරම් මුදල වෙනස්වන අතර එය පියවීම සඳහා නිශ්චිත කාලවකවානුවක් ලබාදීම 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. | නියමිත කාර්යය අවසන් වූ පසු අප්‍රමාදව අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.205,083,615 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,775,154 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.199,308,461 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙහෙයුම් ආදායම් රු.283,924,848 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 වර්ෂයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2 වගන්තිය අනුව 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වීම. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සම්මේලනයේ ආදායම රු.මිලියන 481 ක් හා වියදම රු.මිලියන 276 ක් වූ අතර සම්මේලනය සතුව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති වත්කම්වල එකතුව රු.මිලියන 593 ක් විය. එසේ වුවත් සම්මේලනයේ ගනුදෙනු සම්බන්ධව අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | සම්මේලනයේ ගනුදෙනු සම්බන්ධ අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු වීම. |